# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,484 - 2026 අප්‍රේල් මස 17 සිකුරාදා - 2026.04.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 398 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 400 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 24 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මැයි මස 8 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


297 - B 082778 — (2026/03)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## කොත්මලේ ප්‍රාදේශීය සභාව

### කොත්මලේ ප්‍රාදේශීය සභාවේ අත්‍යවශ්‍ය තනතුරු සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගැනීම

කොත්මලේ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ තනතුරු සඳහා දෛනික පදනමින් සේවයට යොදවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 03කට වැඩි කාලයක් ස්ථිර පදිංචියක් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | සේවක ගණය | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගන්නා පදනම | දෛනික වැටුප් ගෙවීමේ පදනම |
|---|---|---|---|---|---|
| 01. | රියදුරු | ප්‍රාථමික ශිල්පීය | 01 | දෛනික පදනම මත | රා.ප.ච.10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| 02. | ආදාහනාගාර ක්‍රියාකරු | ප්‍රාථමික අර්ධ ශිල්පීය | 01 | දෛනික පදනම මත | රා.ප.ච.10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| 03. | සෞඛ්‍ය කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 04 | දෛනික පදනම මත | රා.ප.ච.10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| 04. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 08 | දෛනික පදනම මත | රා.ප.ච.10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| 05. | මුරකරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | දෛනික පදනම මත | රා.ප.ච.10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| 06. | ආදාහනාගාර ක්‍රියාකරු සහායක | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | දෛනික පදනම මත | රා.ප.ච.10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |

රියදුරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්(මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල රියදුරු (ප්‍රාථමික ශිල්පීය) සේවා ව්‍යවස්ථාව අනුව සම්පූර්ණ කළ යුතු සුදුසුකම්):

01.1 බඳවා ගන්නා ශ්‍රේණිය: III ශ්‍රේණිය (දෛනික පදනම මත)

01-02 සුදුසුකම්:

01.2.1 අධ්‍යාපන සුදුසුකම්: අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම,මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

01.2.2 වෘත්තීය සුදුසුකම්: මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ පහත තනතුර සඳහා අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

| තනතුරු නාමය | සම්පූර්ණ කළයුතු සුදුසුකම් | කාර්යය |
|---|---|---|
| රියදුරු | තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම.(බඳවා ගන්නා දිනට වසර 03කට පෙර,මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2009.03.11 දිනට පෙර නිකුත් කරන ලද "ඒ" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.) | මූලික අවශ්‍යතාවයන් වන ප්‍රවාහනය සම්බන්ධ කාර්යයන්ගෙන් සමන්විත වූ කාර්යභාරයක් සහ ගරු සභාපති/ලේකම් විසින් සේවයේ අවශ්‍යතාවය මත පවරනු ලබන රාජකාරී කටයුතු ද මෙම තනතුරු දරන්නන්ට පැවරේ. |

01.2.3. පළපුරුද්ද:

මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම(පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

01.2.4. කායික සුදුසුකම්:

i. අවම උස අඩි 05 අඟල් 02,1/2 ක් විය යුතුය.

ii සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය..

01.2.5 වෙනත්:

මහා මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.

01.3 බඳවා ගැනීමේ ක්‍රමය:

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගේ වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ.

01.03.1 ලිඛිත විභාගය:පහත සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**පළාත් පාලන රියදුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය:**

1. විභාගය පිළිබඳ විස්තර:

| *අනු අංකය* | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01. | මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| 02. | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 20% |

2. මෙම පරීක්ෂණය කොත්මලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.
3. තරග විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ.
4. සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක්(40%) ලබා ගත යුතු වේ.

5. විභාගය සඳහා විෂයය නිර්දේශය:

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි |

1.4 වෘත්තිය පරීක්ෂණය :

| *අනු. අංකය* | *පරීක්ෂා කර ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. | රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබා ගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තිය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ. |
| 2. | මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| | මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

02. ආදාහනාගාර ක්‍රියාකරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් (මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ව්‍යවස්ථාව අනුව):-

2.1 බඳවා ගන්නා ශ්‍රේණිය: 111 ශ්‍රේණිය (දෛනික පදනම මත)

2.2 සුදුසුකම්:

02.2.1 අධ්‍යාපන සුදුසුකම්: අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම හෝ ජාතික වෘත්තීය සුදුසුකම්හි (NVQ) 3 සුදුසුකම ලබා තිබීම.(රා.ප.ච 28/2016 අනුව)

2.2.2 පළපුරුද්ද:

අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි.

2.2.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර:-

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 50 | උපරිම ලකුණු ලබාගත් අයැදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ. |
| තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රශ්ණ කිරීම | 40 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 10 | |
| මුළු ලකුණු | 100 | |

03. මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන ගණයට අදාළ තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්:

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *කාර්යයය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | සෞඛ්‍ය කම්කරු | 04 | මාර්ග දෙපස කාණු පවිත්‍ර කිරීම,කසල එකතුකර කසල ප්‍රවාහන රථවලට දැමීම,පොදු වැසිකිළි හා කැසිකිළි පවිත්‍ර කිරීම,පොදු ස්ථාන ඇමදීම යන කාර්යයන් ඇතුළුව පිරිසිදු කිරීමේ කාර්යයන්,ආයතනයේ සහ වැසිකිළි අවට පරිසරය පවිත්‍රව තබා ගැනීම.<br>පළාත් පාලන ආයතනය සතු ක්‍රීඩා පිටි,මාර්ග හා විවෘත පරිශ්‍රයන් ශුද්ධ පවිත්‍ර කිරීම සහ මාර්ගවලට අදාළ කාණු හා බෝක්කු ශුද්ධ පවිත්‍ර කිරීම. | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම,මින් විෂයයන් 05ක් එකවරකදී සමත් වී තිබිය යුතුයි.<br>සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවල 5 ශ්‍රේණිය සමත් අයවළුන් සේවයේ යෙදවීමට කටයුතු කරනු ලැබේ. |
| 02. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 08 | | |

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *කාර්යයය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 03. | මුරකරු | 01 | පළාත් පාලන ආයතනය සතු ආදාහනාගාරය එහි දේපළ සමඟ එම පරිශ්‍රය සහ සේවා අවශ්‍යතාවය මත වෙනත් පරිශ්‍රයක සේවයේ යෙදවීමේදී ඊට අදාළ දේපළ,ගොඩනැගිලි සහ වාහන ආදිය ආරක්ෂා කිරීම. (රාත්‍රී නිවාඩු දින ඇතුළත්) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. |
| 04. | ආදාහනාගාර ක්‍රියාකරු සහායක | 01 | ආදාහනාගාරයේ කාර්යයන්ට සහාය වීම,සුසාන භූමියේ වලවල් කැපීම,සුසාන භූමි උයන උදලු ගා පිරිසිදු කර අලංකාරව තබා ගැනීම. | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. |

3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර:-

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය 100* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ.උපරිම ලකුණු ලබා ගත් අයැදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ. |
| පළපුරුද්ද | 55 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණුවල එකතුව | 100 | |

04. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි:

I. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

II. අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.

III. සෑම අයදුම්කරුවෙකුම තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

V. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු අතර,දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.

VI. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබුවකු නොවිය යුතුය.

VII. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

VIII. මෙම බඳවා ගැනීම සඳහා සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබියයුතුය.

IX. අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන කාලසීමාව අතරතුර කාලයේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලය කොත්මලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

X. මෙය ස්ථිර සේවයේ කිසිදු පත්වීමක් ලැබීම සඳහා හිමිකමක් නොවන අතර,මෙය හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් බඳවා ගැනීමක් පමණි.

05. බඳවා ගැනීමේ ක්‍රමය:

I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් බඳවා ගැනේ.

II. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

06. අයදුම් කළයුතු ආකාරය:

අයදුම්කරුවන් මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙළ කරන ලද අයදුම්පත් 2026 මැයි 08 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ " ලේකම්,කොත්මලේ ප්‍රාදේශීය සභාව, පූඩළුඔය "යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.එක් අයදුම්කරුවෙකු තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් ඒ ඒ තනතුරු සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර,නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුයි.

a. උප්පැන්න සහතිකය
b. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත
c. අධ්‍යාපන සහතික
d. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතිකය
e. පදිංචිය තහවුරු කිරීම පිණිස ග්‍රාම නිලධාරී සහතිකය.(ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.)
f. මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්(01ක් තමා පදිංචි කොටසේ ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.)
g. කොත්මලේ ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්
h. පොලිස් වාර්තාව

අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන කාලසීමාව අතරතුර කාලසීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය කොත්මලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.
මෙම නිවේදනයේ සිංහල,දෙමළ අනුවාදනයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්,සිංහල නිවේදනය අනුව අදාළ කරුණු බල පැවැත්වේ.

**එච්. එම්. ජී. අජිත් පුෂ්පකුමාර,**
ලේකම්,
කොත්මලේ ප්‍රාදේශීය සභාව.

2026ක් වූ අප්‍රේල් මස 17 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය සභාව,
පූඩළුඔය.

**කොත්මලේ ප්‍රාදේශීය සභාවේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීම**

අයදුම් කරන තනතුරට ඉදිරියෙන් ✓ ලකුණ යොදන්න.

| | | |
|---|---|---|
| 1 | රියදුරු | |
| 2 | ආදාහනාගාර ක්‍රියාකරු | |
| 3 | සෞඛ්‍ය කම්කරු | |
| 4 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | |
| 5 | මුරකරු | |
| 6 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක | |

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම:-..........................................................................................................

2. මුලකුරු සමග නම :-..........................................................................................................................

3. ස්ථිර ලිපිනය:-.................................................................................................................................

4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:-.......................................................................................................................

5. උපන් දිනය:- වර්ෂය:-.................. මාසය:-...................... දිනය:-.........................

6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස: අවුරුදු:..................... මාස:................. දින:.................

7. ජාතික හැඳුනුම්පත් අංකය:.......................................

8. දුරකතන අංකය:-......................................

9. විවාහක/අවිවාහක බව:-..................................................

10. ස්ත්‍රී/පුරුෂ භාවය:................................................................

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන්ද/ලියාපදිංචි වීමෙන්ද/යන වග:............................

12. රියදුරු බලපත්‍ර අංකය (අදාළ නම් පමණි) ...................................

13. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න)

අ.පො.ස. (සා.පෙළ) විභාගය

පළමුවර- සමත් වර්ෂය:.................. විභාග අංකය:.............................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

දෙවනවර- සමත් වර්ෂය:.................. විභාග අංකය:.............................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

අ.පො.ස. (උ.පෙළ) විභාගය

සමත් වර්ෂය:.................. විභාග අංකය:.............................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |
| 05. | |

14. ඉල්ලුම් කරන තනතුරට අදාළ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද:-.......................................................................... ........
..........................................................................................................................................................................

15. වෙනත් සුදුසුකම්:....................................................................................................................... ...........................
..........................................................................................................................................................................

16. 1. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?:.........................

2. පිළිතුරු "ඔව්" නම් විස්තර සඳහන් කරන්න:..............................................................................

17. මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද එහිතව සේවයෙන් පහ කිරීමට යටත්වන බවද දනිමි.

............................................,
. අයදුම්කරුගේ අත්සන.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/විශ්‍රාම ප්‍රධානියෙකු/කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදා අධිකාරිලත් නිලධාරියෙකු/රු.224,260.00ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජකවරයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුයි. ඉහත අත්සන් කර ඇති ..............................................................................මහතා/මහත්මිය/මෙනවිය මා හොඳින් දන්නා අඳුනන බවත්,ඔහු මා ඉදිරිපිට දී අත්සන යෙදූ බවත්, මෙයින් සහතික කරමි.

..........................................,
අත්සන හා නිල මුද්‍රාව.

නම:..................................................
තනතුර:............................................
ලිපිනය:............................................
දිනය:...............................................

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්.........................................................................................................මහතා/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ............................................ වශයෙන් සේවය කරන අතර, මොහු/මැය කිසියම් විනයානුකූල දඬුවමකට ලක්වී නොමැති බව පෞද්ගලික ලිපි ගොනුව අනුව සහතික කරමි.අයදුම්පත නිර්දේශ කරමි.

.......................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම:-..................................................
පදවි නාමය:-............................................
දෙපාර්තමේන්තුව/ආයතනය:-............................................
දිනය:-...............................................

04-222

# පළාත් පාලන නිවේදන

## බෙන්තොට ප්‍රාදේශීය සභාව

ගෝසාතක ස්ථාන සම්බන්ධයෙන් වූ විරෝධතා කැඳවීමේ දැන්වීම

බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍ර දේශය තුළ පිහිටි 12සී තුන්දූව බටහිර ග්‍රාම නිලධාරි වසමේ හබුරුගල, තුන්දූව, 250A යන ස්ථානය 2026 වර්ෂයට අදාළව ගෝසාතක ස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා එකී ලිපිනයේ පදිංචි ඩී. එම්. එම්. නසීර් නැමැති අය මා වෙතින් ඉල්ලුම් කර ඇත. එබැවින් එකී ස්ථානයේ ගෝසාතක ව්‍යාපාරයක් හා හබුරුගල, තුන්දූව, තුන්දූව හන්දිය ලිපිනයේ මාංශ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් දක්වන බෙන්තොට ප්‍රා දේශීය සභා බල ප්‍රෙද්ශයේ පදිංචිකරුවකු සිටී නම් මෙම නිවේදනය ප්‍රකාශයට පත් වූ දින සිට දින 14 ක් ඇතුළත එකී විරෝධතාවයට හේතුවන කරුණු ඇතුළත් ලිඛිත ප්‍රකාශනයක් පිටපත් දෙකකින් යුතුව ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා වෙත ලැබීමට සලස්වන මෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභ පනතේ 102 වගන්තිය ද සමග කියවිය යුතු ගෝසාතක ආඥාපනතේ 7 වගන්තිය අනුව මෙයින් නිවේදනය කරමි.

ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.

04-206

---

## බියගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව පහත විස්තර සඳහන් කර ඇති මාර්ගය “ ශ්‍රී ඤාණමෝලි නාහිමි මාවත” ලෙස නම් කිරීම සඳහා බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය පහත පරිදි නම් කරනු ලැබ ඇති බැව් නිවේදනය කරනු ලැබේ.

කු. ආ. දෝ. ලාල් කුමාරපේලි,
සභාපති,
බියගම ප්‍රාදේශීය සභාව.

2026 මාර්තු 16 දින,
බියගම ප්‍රාදේශීය සභාවේ දී ය.

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : | බියගම ප්‍රාදේශීය සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : | ගම්පහ |
| 03. | ග්‍රාම නිලධාරි කොට්ඨාශය | : | මාකොළ උතුර පහළ |
| 04. | දැනට භාවිතා වන නම | : | ඤාණමෝලි මාවත |
| 05. | අලුතින් යොදා ඇති නම | : | ශ්‍රී ඤාණමෝලි නාහිමි මාවත |
| 06. | මාර්ගයේ ආරම්භය | : | මාකොළ මංසන්ධියෙන් |
| 07. | මාර්ගයේ අවසානය | : | අංක 238 යන ලිපිනයෙහි පදිංචි එස්. ඒ. ලීලාවතී යන අයගේ නිවසින් |

04-210/1

## බියගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව පහත විස්තර සඳහන් කර ඇති මාර්ගය “8 වන පටුමග” ලෙස නම් කිරීම සඳහා බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය පහත පරිදි නම් කරනු ලැබ ඇති බැව් නිවේදනය කරනු ලැබේ.

කු. ආ. දෝ. ලාල් කුමාරපේලි,
සභාපති,
බියගම ප්‍රාදේශීය සභාව.

2026 මාර්තු 16 දින,
බියගම ප්‍රාදේශීය සභාවේ දී ය.

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | : | බියගම ප්‍රාදේශීය සභාව |
| 02. | දිස්ත්‍රික්කය | : | ගම්පහ |
| 03. | ග්‍රාම නිලධාරි කොට්ඨාශය | : | 272/A, මීගහවත්ත බටහිර |
| 04. | දැනට භාවිතා වන නම | : | - |
| 05. | අලුතින් යොදා ඇති නම | : | 8 වන පටුමග |
| 06. | මාර්ගයේ ආරම්භය | : | අංක 61/5, යන ලිපිනයෙහි පදිංචි ඩී. විජේසිංහ යන අයගේ නිවස පිහිටි ඉඩම අවසානයෙන් |
| 07. | මාර්ගයේ අවසානය | : | අංක 61/6/H/1, යන ලිපිනයෙහි පදිංචි කේ. පී. සේනානි සිසිරකාන්ති යන අයගේ නිවස පිහිටි ඉඩම අවසානයෙන් |

04-210/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.